ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1983 අංක 19 දරන

# මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 මැයි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1983 මැයි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 19 දරන මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1983 මැයි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 12/82

**මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.** "මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසයට සම්බන්ධ සියලු කරුණු සාර්ථක ලෙස කරගෙන යාමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මාකොළ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී ආයතනය සංස්ථාගත කිරීමට ඉල්ලුම්කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන ප්‍රයෝජනය සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.** 1. මේ පනත 1983 අංක 19 දරන මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසය සංස්ථාගත කිරීම.** 2. (මෙහි මින් මතු "අනත්දරු නිවාසය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන වෙනත් තැනැත්තන් ද මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මාකොළ මුස්ලිම් අනත්දරු නිවාසය" යන අභිධානය සහ නාමය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, ඒ සංස්ථාව විසින් ද ඒ සංස්ථාවට විරුද්ධව ද එම නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට හා අලුත් කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.** 3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පිළිසරණ අවශ්‍ය මුස්ලිම් අනත්දරුවන්ට ඉස්ලාමීය ෂරියත් ශික්ෂාවලට අනුකූලව ආදරය කිරීම, ඔවුන් හදාවඩාගැනීම සහ ඔවුන්ට උවටැන් කිරීම;

(ආ) එවැනි අනත්දරුවන්ට ආගමික දැනීම ලබා දී එමගින් ඔවුන් අතර ඉස්ලාමීය ජීවන මාර්ගය නංවාලීම;

(ඇ) එවැනි අනත්දරුවන්ට අධ්‍යාපනය ලබා දීම;

ඒ 61765—7,900 (83/03)

(ඇ) එවැනි අනාථ දරුවන්ට අර්ථවත් සේවා නියුක්තියක් ලැබෙන තෙක් ඔවුන්ට පදිංචිවීමට සහ සේවය කිරීමට අනාථ දරු නිවාස, නිවාස, ආරෝග්‍යශාලා, ඖෂධාල, ශායන සහ වෘත්තීය හා ආගමික අභ්‍යාස මධ්‍යස්ථාන ඉදි කිරීම, ඒවා නඩත්තු කිරීම, කළමනාකරණය කිරීම, පිහිටුවීම හා වැඩිදියුණු කිරීම ;

(ඉ) අනාථ දරු නිවාස හා නිවාස ඉදිකිරීමත් ඒවා නඩත්තු කිරීමත් සඳහා ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල සිටින ත්‍යාගශීලීන්ගෙන් අරමුදල් එකතු කිරීම සහ පරිත්‍යාග සහ ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිගැනීම ; සහ

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, යම් ගිණුමක තැන්පත් කරන යම් මුදලකට පොළිය එකතු නොවන ආකාරයේ වූ ජංගම හෝ වෙනත් වර්ගයක ගිණුමක් යම් බැංකුවක හෝ බැංකුවල ආරම්භ කිරීමේ, එය ක්‍රියාත්මක කිරීමේ සහ වසා දැමීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය සේවයට බඳවා ගැනීමේ, සේවයේ යෙදවීමේ හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ සියල්ල හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා හෝ වැඩිදියුණු කරලීම් සඳහා හෝ අවශ්‍ය වන නැතහොත් යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ පාලක මණ්ඩලය.

5. (1) නිලධරයන්ගෙන් සහ, සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද ඒ රීතිවලට අනුව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන අවස්ථාවේ දී නිලය දරන, අනාථ දරු නිවාසයේ පාලක මණ්ඩලය, සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළුකර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහාත් සංස්ථාවේ පාලක මණ්ඩලයේ සහ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සඳහාත් සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සඳහාත් සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාත්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, තත් කාර්යය සඳහා යටත් පිරිසෙයින් දෙසතියක් කල් තබා සාමාජිකයන්ට දැනුම් දී විශේෂයෙන් කැඳවනු ලැබූ සංස්ථාවේ යම් මහ සභා රැස්වීමක දී, සංස්ථාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු (නොපැමිණි සාමාජිකයන් ද ඇතුළුව) සාමාජික සංඛ්‍යාවකගේ බහුතර ඡන්දයෙන් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සෑදනු ලැබිය හැකි ආකාරයෙන් ම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

අනාත්දරු නිවාසය විසින් ගෙවිය යුතු සහ ඊට ගෙවනු ලැබිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ දී පැවති අනාත්දරු නිවාසයේ සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, අනාත්දරු නිවාස යට අය විය යුතු සියලු ණය සහ ඊට ගෙවිය යුතු සියලු මුදල් හා සම්මාදම්, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. සභාපතිවරයා හෝ, සභාපතිවරයා නොමැති විටක උප සභාපතිවරයකු සහ ගරු සමලේකම්වරයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතුය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිර ව කරනු ලැබිය යුතුය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට (ඒ දේපළට අදාළ යම් භාරය කට සහ ඒ භාරය විධිමත් කැරෙන නීතියට යටත්ව) සම්පූර්ණ බලය සහිතව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතුය :

එසේ වුවද, සංස්ථාව විසින් ඒ දේපළ සම්බන්ධයෙන් අදහස් කරනු ලබන සෑම මිලට ගැනීමක් ම, විකිණීමක් ම, (බදු දීම හෝ හුවමාරු කිරීම් ඇතුළුව) බැහැර කිරීමක් හෝ අත් සතු කිරීමක්ම කළ යුතු වන්නේ තත් කාර්යය සඳහා යථා පරිදි කැඳවනු ලැබූ පාලක මණ්ඩලයේ රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන පාලක මණ්ඩල සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දය මගින් පාලක මණ්ඩලයේ පූර්ව අනුමතිය ඒ සඳහා ලබා ගෙන තිබුණහොත් පමණකි.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය.

[illegible]

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.